# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 35 දරන
# කුඩා තේ වතු සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

75 සැප්තැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදි)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 55 යි      තැපැල් ගාස්තුව : ශත 15 යි

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන
## කුඩා තේ වතු සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 3/74.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන රාජ්‍ය අධිකාරියක් පිහිටුවීම පිණිස ද; කුඩා තේ වතු සංවර්ධනය, කළමනාකරණය හා ඒවා විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; නිශ්චල හා චංචල දේපළ අනිවාර්යයෙන් අත්කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඉහත කී දේවලට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.** 1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවීම

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවීම.** 2. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මේ පනතෙහි "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබේ.

**අධිකාරිය සංස්ථාවක් වන බව.** 3. අධිකාරිය 2 වන වගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් සංස්ථාවක් වන අතර එයට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේය. එම නාමයෙන් අධිකාරිය විසින් ද අධිකාරියට විරුද්ධ ව ද නඩු පවරනු ලැබිය හැකිය.

**අධිකාරියේ සාමාජිකයෝ.** 4. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් අධිකාරිය සමන්විත වේ :—

(i) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයාගේ නියෝජිතයෙක්,

(ii) තේ කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයා,

(iii) ඉඩම් කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයා,

(iv) වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නියෝජිතයන් දෙදෙනෙක්, සහ

(v) වෙළෙඳ අමාත්‍යවරයාගේ නියෝජිතයෙක්.

(2) අමාත්‍යවරයා විසින්, අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් කෙනකු අධිකාරියේ සභාපති වශයෙන් පත් කළ යුතුය.

**ගණපූරණය.** 5. අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජිකයන් සංඛ්‍යාව තුන් දෙනෙකි.

**සාමාජිකයන්ගේ ධුර කාලය.** 6. (1) යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ වෙනත් හේතුවක් නිසා ඔහු කලින් ධුරය හිස් කළ හොත් මිස සෑම සාමාජිකයෙක් ම අවුරුදු පහක කාල පරිච්ඡේදයක් ධුරය දරන්නේය :

2—ඒ 15446—11,235 (75/07)

එසේ වුව ද ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ වෙනත් හේතුවක් නිසා ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයෙක්, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ වෙනත් හේතුවක් නිසා ඔහු ධුරය හිස් කළහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාල පරිච්ඡේදය තුළ ධුරය දරන්නේය.

(2) අධිකාරියේ කවර සාමාජිකයකු වුව ද නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම.

7. (1) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සාමාජිකයකු විසින් ධුරයෙන් අස් විය හැකිය.

(2) සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, කිසිම හේතුවක් නො දක්වා ඔහු විසින් එසේ කළ හැකිය.

(3) අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තම ධුරයෙහි කටයුතු කිරීමට සාමාජිකයා තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු පත් කළ හැකිය.

රැස්වීම.

8. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, අධිකාරියේ රැස්වීම් පිළිබඳව ද ඒ රැස්වීම්වල දී කරනු ලබන කටයුතු පිළිබඳව ද වූ ස්වකීය කාර්ය පරිපාටිය අධිකාරිය විසින් විධිමත් කළ හැකිය.

රැස්වීම්වල මූලාසනය දැරීම.

9. (1) තමා පැමිණ සිටින අධිකාරියේ සෑම රැස්වීමක ම මූලාසනය අධිකාරියේ සභාපති විසින් දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි විටෙක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තෝරා ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන්නාහට ස්වකීය ඡන්දයට අතිරේක වශයෙන් තීරක ඡන්දයක් ඇත.

සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හේතු කොට ගෙන අධිකාරියේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස නොසැලකිය යුතු බව.

10. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හෝ හේ. නිසා පමණක් අධිකාරියේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලං ලෙස සලකනු නොලැබිය යුතුය.

අධිකාරියේ මුද්‍රාව.

11. (1) අධිකාරියට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය අධිකාරිය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තාගේ භාරයෙහි තිබිය යුතුය.

(2) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර අධිකාරියේ මුද්‍රාව යම් සාධක පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල හෝ ලේඛනවල රෙජිස්ටරයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යා යුතුය.

අධිකාරිය විසින් එළඹීමට යෝජිත ගිවිසුම් විෂයෙහි ඇති සම්බන්ධතා සාමාජිකයන් විසින් හෙළි කළ යුතු බව.

12. අධිකාරිය විසින් එළඹීමට යෝජිත යම් ගිවිසුමක් විෂයෙහි සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින් තම සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමකදී එළිදරව් කළ යුතුය. ඒ එළිදරව් කිරීම අධිකාරියේ වාර්තා පොතෙහි සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් සලකා බැලීමකදී ඒ සාමාජිකයා ඊට සහභාගි නොවිය යුතුය.

අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

13. මුදල් අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට හා එසේ නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතුය.

## II වන කොටස

### අධිකාරියේ කාර්ය සහ බලතල

අධිකාරියේ කාර්ය.

14. අධිකාරියේ කාර්ය වනාහි,—

(අ) කුඩා තේ වතුවල සහ තමන්ගේ ම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවල සංවර්ධනයට අනුබල දීම හෝ ඒවා සංවර්ධනය කිරීම භාර ගැනීම ;

(ආ) එකී තේ ඉඩම්වල පලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම ;

(ඇ) ඒ කර්මාන්තශාලාවල හෝ ඒ තේ ඉඩම්වල කෙරෙන නිෂ්පාදනවල අලෙවිය දියුණු කිරීම හෝ ඒ අලෙවි කිරීම භාර ගැනීම ;

(ඈ) ඒ කර්මාන්තශාලා සහ ඒ තේ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පහසුකම් සහ සේවාවන් සපයා දීම හෝ ලබා දීම සඳහා නැතහොත් ඒ පහසුකම් හා සේවාවන් සපයා දීම හෝ ලබා දීම පහසු කිරීම සඳහා ද ඒ ඉඩම්වල පලදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඒවා පැසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ගේ ශුභ සිද්ධිය සඳහා ද අවශ්‍ය සියලු පියවර ගැනීම;

යන මේවාය.

අධිකාරියේ බලතල.

15. (1) අධිකාරියේ කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ වැඩදායි හෝ ආනුෂංගික හෝ වන සියලු ක්‍රියා කිරීමටත් සියලු පියවර ගැනීමටත් අධිකාරියට බලය ඇත්තේය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් කටයුතු කිරීමට අධිකාරියට බලය ඇත්තේය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපන කිරීම, විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම ;

(ආ) අධිකාරියේ කාර්ය කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ වන සියලුම ගිවිසුම් වලට සහ එකඟවීම්වලට කෙලින්ම හෝ අධිකාරිය විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු නැතහොත් නියෝජිතයකු මගින් හෝ ඇතුළත් වීම හා ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) අධිකාරියේ කාර්ය කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ විය හැකි කවර වුව ද දෙයක් සෑදීම, නිෂ්පාදනය කිරීම, මිළට ගැනීම, පවත්වාගෙන යාම සහ අලුත්වැඩියා කිරීම ;

(ඈ) අධිකාරියේ කාර්ය කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ විය හැකි යම් ද්‍රව්‍යයක්, උපකරණයක් හෝ යන්ත්‍ර සූත්‍ර මිළට ගැනීම, ප්‍රවාහණය කිරීම, ගබඩා කිරීම සහ සැපයීම ;

(ඉ) අධිකාරියේ කාර්ය කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ විය හැකි නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් පත් කිරීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් පාලනය කිරීම ;

(ඊ) අධිකාරියේ කාර්ය කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ විය හැකි වැඩ කිරීම සඳහා තැනැත්තන් පුහුණු කිරීම හෝ ඔවුන් පුහුණු කිරීම සඳහා මුදලින් ආධාර කිරීම ;

(උ) අධිකාරිය විසින් සේවයෙහි යොදවනු ලබන හෝ අධිකාරිය යටතේ සේවය කරන හෝ තැනැත්තන් සඳහා ශුභසාධක හා විනෝද පහසුකම් ද, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් එවැනි ඉඩපහසුකම් ද පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඌ) අධිකාරියේ කාර්ය කිරීමට අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ විය හැකි කවර වුව ද අන්දමක සේවාවන් සැපයීම ;

(එ) අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා සහ සපයනු ලබන පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකිරීම ;

(ඒ) කුඩා වතුවල හෝ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වතුවල හෝ තේ වැවීමෙහි යෙදී සිටින යම් සමුපකාර සමිතියකට, සමුපකාර සමිති සංගමයකට හෝ යම් තැනැත්තකුට හෝ (සංස්ථාගත කළ හෝ නොකළ) පුද්ගල මණ්ඩලයකට හෝ, ණය වශයෙන් දෙනු ලබන මුදල් ආධාර, ණය සඳහා ඇපවීම, සහනාධාර සහ දීමනා ඇතුළුව ආධාර සැපයීම ;

(ඔ) ඒ කුඩා තේ වතු කළමනාකරණය කිරීම හෝ, ඒවායේ කළමනාකරණයට සහභාගී වීම හෝ, ඒවායේ කළමනාකරණයෙහි ලා සහාය වීම හෝ අධීක්ෂණය කිරීම ;

(ඕ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ක) (i) අධිකාරියේ කාර්ය කිරීමට නැතහොත් බලතල ක්‍රියාත්මක කිරීමට හෝ අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ වන කවර කරුණක් සම්බන්ධයෙන් වුව ද අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකින් වූ ද එසේ නිශ්චය කරනු ලබන විස්තර අඩංගු වූ ද සත්‍ය හා නිවැරදි වාර්තා පවත්වාගෙන යන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම ;

(ii) අධිකාරියේ කාර්ය කිරීමට නැතහොත් බලතල ක්‍රියාත්මක කිරීමට හෝ අවශ්‍ය හෝ වැඩදායී හෝ ආනුෂංගික හෝ වන කවර කරුණක් සම්බන්ධයෙන් වුව ද තමා දන්නා සියලු වාර වාර්තා, තොරතුරු සහ පැහැදිලිකිරීම්, නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත සපයන ලෙස, යම් තැනැත්තකුට නියම කිරීම ;

(iii) (i) වන අනුඡේදය යටතේ පවත්වා ගෙන යනු ලබන යම් වාර්තාවක සටහනක් කරන ලද හෝ (ii) වන අනුඡේදය යටතේ සපයන ලද යම් වාර වාර්තාවක, තොරතුරක හෝ පැහැදිලි කිරීමක සඳහන් කරන ලද හෝ යම් කරුණුවල සත්‍ය අසත්‍යතාව බැලීමේ කාර්යය සඳහා අධිකාරියට අවශ්‍ය වන යම් ලේඛනමය හෝ වෙනත් සාක්ෂි, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර, ඉදිරිපත් කරන ලෙස හෝ ඉදිරිපත් කිරීමට සලස්වන ලෙස, යම් තැනැත්තකුට නියම කිරීම ;

(iv) යම් වාර්තා විභාග කිරීමේ කාර්ය හා ඒවායේ සත්‍ය අසත්‍යතාව බැලීමේ කාර්ය සඳහා සහ (i) වන සහ (ii) වන අනුඡේද යටතේ අධිකාරියට සපයන ලද යම් වාර වාර්තාවක, තොරතුරක හෝ පැහැදිලි කිරීමක ඇතුළත් යම් විස්තරවල සත්‍ය අසත්‍යතාව බැලීමේ කාර්ය සඳහා යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට, කාර්යාලයකට, ගබඩාවකට, කර්මාන්තශාලාවකට, මඩුවකට හෝ ස්ථානයකට යම් සාධාරණ වේලාවක ඇතුළුවී පරීක්ෂා කිරීම ; සහ

(v) එම තේ ඉඩම්වල පලදාව සහ ඒවායේ නිෂ්පාදන තොග පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ කාර්ය සඳහා යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට, කාර්යාලයකට, ගබඩාවකට, කර්මාන්තශාලාවකට, මඩුවකට හෝ ස්ථානයකට, යම් සාධාරණ වේලාවක ඇතුළු වීම.

(3) (2) වන උපවගන්තියේ (ක) ඡේදයේ (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ හෝ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින හෝ, දැන දැනම වැරදි වාර්තා පවත්වාගෙන යන හෝ වැරදි වාර වාර්තා, තොරතුරු, පැහැදිලි කිරීම් හෝ ලේඛනමය හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කරන හෝ, (2) වන උපවගන්තියේ (ක) ඡේදයේ (iv) වන අනුඡේදයෙන් හෝ (v) වන අනුඡේදයෙන් අධිකාරිය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා අධිකාරියට බාධා කරන, යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේය.

තේ මණ්ඩලයේ බලතල සහ කාර්ය, අධිකාරිය වෙත පැවරීම.

**16.** තේ මණ්ඩලය විසින් ඒ මණ්ඩලයේ බලතලවලින් හා කාර්ය යන්ගෙන් යමක්, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, අධිකාරිය වෙත පැවරිය හැකිය.

අධිකාරියේ බලතල සහ කාර්ය පැවරීම.

**17.** (1) අධිකාරිය විසින් ස්වකීය බලතලවලින් සහ කාර්යවලින් යමක් අධිකාරියේ යම් සාමාජිකයකුට හෝ යම් නිලධරයකුට හෝ පැවරිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරනු ලැබූ සෑම සාමාජිකයකු ම හෝ සෑම සේවකයකු ම ඒ බලය ක්‍රියාවේ යෙදීම හෝ ඒ කාර්යය කිරීම, අධිකාරියේ විධානයට සහ පාලන යට යටත්ව, කළ යුතුය.

අධිකාරිය අමාත්‍යවරයාගේ විධානයට යටත් බව.

**18.** අධිකාරියේ බලතල, යුතුකම් හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී සහ කිරීමේ දී අධිකාරිය අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධාන යට හා පාලනයට යටත් වන්නේය.

## III වන කොටස

### අධිකාරියේ මුදල් සහ ගිණුම්

අධිකාරියේ ප්‍රාග්ධනය.

**19.** (1) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලක් විය යුතු අතර, එකී ප්‍රාග්ධනය—

(අ) ආණ්ඩුව විසින් දෙනු ලබන ප්‍රදානවලින් ;

(ආ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින්, එය දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් වූ විට ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව භාර අමාත්‍යවරයාගේ ද පළාත් පාලන ආයතනයක් වූ විට පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ ද නියමයක් හෝ කැමැත්ත හෝ අනුව, අධිකාරියට පවරා දෙනු ලබන යම් ශුද්ධ වත්කම්වල වටිනාකමෙන් ; සහ

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි පිට ආණ්ඩුව විසින් දෙනු ලබන හෝ ලබා ගැනීමට සලස්වන ණය මුදල්වලින්

සමන්විත විය යුතුය.

(2) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් අධිකාරියට ගෙවිය යුතු ය ; නැතහොත් ලබා ගැනීමට සැලැස්විය යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අධිකාරියට පවරා දෙනු ලබන ශුද්ධ වත්කම්වල වටිනාකම සහ ජාතික රාජ්‍ය සභාවේ යම් විසර්ජන පනතකින් හෝ යම් යෝජනා සම්මතයකින් හෝ අනුමත කරනු ලබන මුදල් ද මගින් අධිකාරියේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කර ගත හැකි ය. ඒ මුදල් ප්‍රමාණ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි පිට ආණ්ඩුව විසින් මුදලින් හෝ වර්ගයෙන්, ප්‍රදානයක් හෝ ණයක් වශයෙන්, ගෙවිය යුතුය. නැතහොත් ලබා ගැනීමට සැලැස්විය යුතුය.

**20.** අධිකාරියේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ ව එම වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසාන වන්නේය. අධිකාරියේ මුදල් වර්ෂය.

**21.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව අධිකාරියේ මුදල් පාලනයට හා ගිණුම්වලට අදාළ වන්නේය. 1971 අංක 38 දරන මුදල් පනත අදාළ වන බව.

## IV වන කොටස

### පොදු විධිවිධාන

**22.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේ හා බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝගය, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක වන්නේය. නියෝග සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක්, ඒ අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන්නේය.

(3) මේ පනත යටතේ සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ යම් නියෝගයක විධිවිධාන කඩ කරන හෝ කඩ කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේය.

**23.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින්— ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව කට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් ඇතැම් දේපළක සන්තකය හා පාවිච්චිය ද ඇතැම් ගිවිසුම් ද අධිකාරිය වෙත පැවරීම.

(අ) අධිකාරියේ කාර්ය සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් චංචල හෝ නිශ්චල දේපළක සන්තකය හා පාවිච්චිය අධිකාරිය වෙත පවරා සතුකර දිය හැකිය ; තවද

(ආ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ තේ කර්මාන්තයට සම්බන්ධ යම් ගිවිසුමක් අධිකාරිය වෙත පැවරිය හැකිය :

එසේ වුවද, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ සතු යම් නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නියමයක් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ කරනු ලබන විට, ඒ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව හෝ භාරව සිටින අමාත්‍යවරයාගේ ද, පළාත් පාලන ආයතන යක් සම්බන්ධයෙන් වන විට පළාත් පාලන විෂය භාරව සිටින අමාත්‍ය වරයාගේ ද අනුමතිය නොමැතිව එවැනි නියමයක් නොකළ යුතුය.

(2) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ යම් ගිවිසුමක් අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තිය යටතේ වූ නියමයකින් අධිකාරිය වෙත පවරනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුම අධිකාරියේ ගිවිසුමක් ලෙස සැලකිය යුතු අතර ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ ඒ ගිවිසුම යටතේ පවත්නා අයිතිවාසිකම් හා බැඳීම් අධිකාරියේ අයිතිවාසිකම් හා බැඳීම් ලෙස සැලකිය යුතුය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

24. (1) යම් නිශ්චල දේපළක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අත්කර ගැනීම අවශ්‍ය වූ විට ඒ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ දේපළ අත්කර ගෙන අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවිය යුතුය.

රාජ්‍ය නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

25. (1) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලැබ සිටින අමාත්‍ය වරයාගේ භාරයෙහි ඇති අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කළ හැකි කාල සීමාවක් සඳහා, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කළ හැකිය ; නැතහොත් එහි කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කළ හැකිය.

(2) රාජ්‍ය සේවයෙහි නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලබන අවස්ථාවක 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 44 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන හැර ඒ වගන්තියේ අනිකුත් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(3) රාජ්‍ය සේවයේ නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 44 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(4) නියමිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් සේවා කාලයක් එකී ගිවිසුමෙහි බැඳීම ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

26. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධ ව, හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධ ව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකිය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ එයට විරුද්ධ ව හෝ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවනු ලබන හෝ අධිකාරිය විසින් අය කර ගනු ලබන හෝ යම් ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන පිට හෝ කරන ලද නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධ ව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගනිත හොත්, එකී වියදම අධිකාරිය විසින් එකී තැනැත්තාට කලින් ගෙවන ලද්දේ නම් හෝ එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් එකී වියදම් අය කර ගනු ලැබුවේ නම් හෝ මිස, එම වියදම අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතුය.

27. අධිකාරියට විරුද්ධ ව පවරනු ලැබූ කිසිම නඩුවක දී අධිකාරියේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට හෝ විරුද්ධ ව කිසිම රිට් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

අධිකාරියේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධ ව කිසිම රිට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු බව.

28. මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එකී බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේය.

දණ්ඩන.

29. අධිකාරියේ සියලුම සාමාජිකයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබේ.

අධිකාරියේ සාමාජිකයන් හා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලබන බව.

30. අල්ලස් පනතේ අර්ථානුකූල ව අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලබන අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලබන බව.

8—ඒ 15446 (75/07)

දුෂ්කරතා ලිහිල් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

**31.** මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී, මේ පනත මගින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග මගින් හෝ නියම කර ඇති යම් විධිමත් භාවයක් පිළිපැදීමට ප්‍රමාද දෝෂයකින් යම් තැනැත්තකු අසමත් වීමේ හේතුවෙන් ඒ තැනැත්තාට සැලකිය යුතු දුෂ්කරතාවක් ඇති විය හැකි යයි අමාත්‍යවරයා අදහස් කරන යම් අවස්ථාවක් උද්ගත වූ විට, ඒ දුෂ්කරතා ලිහිල් කිරීමට හෝ වැළැක්වීමට හෝ අවශ්‍ය විය හැකි විධාන අමාත්‍යවරයා විසින් නිකුත් කළ හැකිය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

**32.** වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හා අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන ඒ වෙනත් නීතිය අභිභවා බලපැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය.

**33.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කළමනාකරණය" යන්න එහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් හා සජාතීය යෙදුම් සමග ගත් විට, වගා කිරීම, නැවත වගා කිරීම, පුනරුත්ථාපනය, පෝර කිරීම, පස සංරක්ෂණය හා පලදාව නිෂ්පාදනය කිරීම, පැසුරුම් කිරීම, විකිණීම සහ බැහැර කිරීම එයට ඇතුළත් වේ ;

"කුඩා තේ වතු" යන්නට 1957 අංක 51 දරන තේ පාලන පනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේය ;

"තේ කර්මාන්තශාලාව" යන්නට 1957 අංක 51 දරන තේ පාලන පනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේය ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය නිලධරයා" යන්නට 1972 ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එයට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවන ලබන්නා වූ ද ආණ්ඩුව විසින් සපයනු ලබන්නා වූ මුළු ප්‍රාග්ධනය හෝ ඉන් කොටසක් හෝ ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වන්නේය ; තවද

"විකිණීම" යන්නට සැම්පල් වශයෙන් හෝ වර්ග වශයෙන් හෝ වූ විකිණීමක් ද වහාම හෝ අනාගතයේ දී හෝ භාරදීම සඳහා වූ විකිණීමක් ද ඇතුළත් වේ.